# පැරණි කලා නිර්මාණාංගයක් වන මකර සැරසිල්ලෙහි ප්‍රභවය හා භාවිතය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

**ජී.ජී.වී. විජේසිංහ**

අභයගිරි විහාර ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, අනුරාධපුරය.

vineethawijesingha22@gmail.com

ප්‍රමුඛ පද: මකර රුව, තොරණ, සැරසිල්ල, කොරවක්ගල, මුරගල

## හැඳින්වීම

යම්කිසිරටක සංස්කෘතික උරුමයේ වැදගත් අංගයක් ලෙස එරටෙහි කලා මාධ්‍යයන් හැඳින්වෙයි. ජන සමාජයක සිතුම්පැතුම් පමණක් නොව ඔවුන්ගේ කලා රසඥතාවන්, විද්‍යාත්මක හා තාක්ෂණික ඥානයන් හා ශිල්පීය කුසලතාවන් සාම්ප්‍රදායික කලා මාධ්‍යයන්ගෙන් නිරූපනය කෙරෙයි.

පෙරදිග සාහිත්‍යයේ, කලාවේ, මූර්තියේ, වාස්තුවිද්‍යාවේ මකර සැරසිල්ල විෂයෙහි ලැබෙනුයේ අද්විතීය ස්ථානයකි. මකරා වූ කලී ස්වභාවික සතුන් කිහිපයකගේ හැඩරුවින් නිර්මිත මනඃකල්පිත සත්ත්වයෙකි. එය ආදියේ සිට ම ලාංකේය කැටයම්හි පැමිණි බව කලා කෘති අධ්‍යයනයෙන් පැහැදිලි වේ. පළමු ව මුරගල්, කොරවක්ගල් හා සඳකඩපහණ රූකම් විෂයෙහි භාවිත මකර රුව බුද්ධ ප්‍රතිමාවල පසුබිම් අලංකරණය, විහාරස්ථාන ප්‍රවිෂ්ට දොරටු, සණ්ඨාර කුලුණු, දොර උළුවහු, ජල පිහිලි, ස්තූප වාහල්කඩ කැටයම්හි මෙන් ම දේවාල ආශ්‍රිත ව භාවිත කර ඇත.

මකර සැරසිල්ල පිළිබඳ මෙතෙක් සෘජු අධ්‍යයනයක් සිදු නොවීම නිසා එම ඌණතාව සම්පූර්ණ කිරීමේ අරමුණ සහිතව, මකර සැරසිල්ලේ ප්‍රභවය, භාවිතය සිදු වූ ආකාරය හා එහි සංකේතාර්ථය කුමක් ද?යන ගැටලුව ඔස්සේ කලා කෘති අධ්‍යයනයෙන් මෙම පර්යේෂණය සිදුකෙරෙයි.

## ක්‍රමවේදය

මකර සැරසිල්ලෙහි භාවිතය පිළිබඳ පර්යේෂණයේ දී ක්ෂේත්‍ර නොවෙන අධ්‍යයනය යටතේ පුස්තකාල සමීක්ෂණය මගින් සෘජුව හා වක්‍රව තොරතුරු ලබාගත හැකි සාහිත්‍ය මූලාශ්‍ර පරිශීලනය කරන ලදී. මාතෘකාවට සම්බන්ධ ස්ථානයන්හි ඡායාරූප අධ්‍යයනයෙන් පූර්ව දැණුම ලබා ගන්නා ලදී.

මූලික දත්ත රැස් කිරීම ක්ෂේත්‍ර සමීක්ෂණයෙන් සිදු විය. අධ්‍යයනයේ ස්වභාවය අනුව මේ සඳහා නිශ්චිත වශයෙන්ම එක් අධ්‍යයන ප්‍රදේශයකට සීමා වීම අපහසු නිසා ලංකාව පුරා මකර සැරසිල්ල භාවිත ව ඇති කලා කෘති කිහිපයක් අධ්‍යයනය මඟින්

පර්යේෂණ සඳහා අදාළ දත්ත රැස් කරන ලදී.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**


කලා කෘති අලංකරණයට භාවිත කළසැරසිලි, කැටයම්, රූකම් අතර මකර රූව විෂයෙහි හිමි වන්නේ අද්විතීය ස්ථානයකි. ග්‍රීක බසින් Drakon හා ඉංග්‍රීසි භාෂාවෙන් Dragon නමින් හඳුන්වන මකරා වූ කලී මනඃකල්පිත සත්ත්වයෙක් වන අතර ස්වභාවික සතුන් කිහිපයකගේ හැඩහුරුකම් ආශ්‍රයෙන් නිර්මිත ය. මකර රූව ඇත් සොඬ, සිංහ පාද, කිඹුල් දත්, වඳුරු ඇස්, ඌරු කන්, මත්ස්‍යය පාද සහ විචිත්‍ර පත්‍රයෙන් සමන්විතව නිර්මාණය කළබව 13 වැනි සියවසට අයත් "රූපාවලිය" නම් සංස්කෘත ග්‍රන්ථයෙහි 148 ශ්ලෝකයෙහි විස්තර වේ.

"ගජේන්ද්‍ර හස්තං ධෘත සිංහ පාදං
බරාල දන්තං හනුමද්විනේත්‍රම්
වරාහ කර්ණං හෘදි මත්ස්‍යය දේහං
විචිත්‍ර පත්‍රං මකර ස්වභාවම් "
(චාර්ලස් 1999:57-58)

අටතුරාසියක් මඟුල් ලකුණු වලින් එකක් හා ජ්‍යොතිශාස්ත්‍රයේ හඳුන්වන දොළොස් රාශියෙන් එකක් වන මකර රූව කිඹුලාට හෝ ඩොල්ෆින්ට සමාන බවත් ඉදිරිපස කොටස අවසන් වන්නේ කෙටි හැකිළුණු හොඬකින් බවත් ශරීරය සහ වලිගය පක්ෂියෙකුගේ ස්වභාවයක් ගන්නා බවත් දක්වයි (කුමාරස්වාමි 1962:82-83). මකරා සමුද්‍රයට අධිපති වරුණ දෙවියන්ගේ, අල්ලිස සුවන සහ සියාවස යන නැකැත් දේවතාවුන්ගේ වාහනය මෙන්ම භාරතීය අනංගයාගේ ධජයේ ලාංඡනය ලෙස සැලකෙයි. මකර රූව ක්‍රිස්තු පූර්ව දෙවැනි සියවසේ සිට භාරුත්, සාංචි, මථුරා යන ස්ථානවල ගල් කැටයම්හි දක්නට ලැබෙයි. පසුව භරත කලාව ආභාසය වූ ලංකාව, ඉන්දුනීසියාව, කාම්බෝජය ආදී සංස්කෘතීන්හි මකරා විවිධාකාරයෙන් විහාර කර්මාන්තයන්හි යෙදුණු බව පුරාවිද්‍යා සාධකයන් අධ්‍යයනයෙන් පැහැදිලි වේ (සිල්වා 2009:79-80).

මකර තොරණ වූ කලී එකිනෙකට මුහුණලා ඇති ඉලිප්පුම් මකර රූ දෙකකින් යුක්ත වන අතර මකරුන් දෙදෙනා සම්බන්ධ වන්නේ මුදුනේ කීර්ති මුඛ නම් භයංකර මුහුණකින් යුතු සැරසිලි ආරුක්කුවකිනි (කුමාරස්වාමි 1962:82).

අනුරාධපුර යුගයට අයත් මකර තොරණ විරල ය. බහුල ව ඇත්තේ



කොරවක්ගල හා මුරගලට යෙදූ මකර රූවයි. තන්තිරිමලය වැඩ හිඳිනා බුදු පිළිමය ක්‍රිස්තුවර්ෂ 8 හෝ 9 සියවසට අයත් අතර එහි පසුබිම අලංකරණය සඳහා දෙපසට විහිදීම කර හිස්

දෙකකි. දැදිගම සූතිඝර සෑයේ නිධන් වස්තූන්හි තිබුණු නාවැටපහනේ කිඹිසි මුහුණ රහිත මකර තොරණක කැටයමකි. ගල් විහාරයෙහි හිඳිපිළිම දෙකෙහි ද කිඹිසි මුහුණ රහිත මකර තොරණ වන අතර පොළොන්නරු යුගයෙහි ඒ සඳහා වූ ආවේණික ලක්ෂණ පැහැදිලි වේ.

යාපහු බෝධිඝරයේ ප්‍රවේශ ද්වාරයෙහි මකර තොරණක් වන අතර එහි කිඹිසි මුහුණ දක්නට නොවේ. මකර මුඛයන්ට සම්බන්ධ වන ලියවැලින් සැරසූ ආරුක්කු ආකාර ලීස්තරයට මැදි වූ අවකාශයෙහි ධ්‍යානි මුද්‍රාවෙන් වැඩ හිඳින බුදු පිළිමයකි.

ගම්පල යුගයේ බුදුපිළිම බොහොමයක් රශ්මි මාලාවකින් හා මකර තොරණකින් සැරසූ අතර පිටුපස තොරණ අධිකව විසිතුරුකොට දැක්වීය. ගඩලාදෙණිය, අලවතුර, ලංකාතිලකය, විජයෝත්පාය, වේගිරිය නිදසුන් සපයයි.

මකර තොරණෙහි පරිණාමය අවසන් වූ මහනුවර යුගයෙහි කිඹිසි මුහුණ වෙනුවට සිංහ මුඛය පැමිණි අතර සකලාංග සම්පූර්ණ තොරණ බුදු පිළිමය තැන්පත් වේදිකාව මුදුන සැරසීමට මෙන්ම පිළිමයටම එක්කොට නිර්මාණය වීය. සරල තොරණ පසුබිමෙහි දෙපස දේව රූප, ඉර හඳ කැටයම්, ශක්‍රයා, මහා බ්‍රහ්මයා වැනි රූප තැනීම පොළොන්නරු යුගයෙන් පසු තොරණවල දැක්වෙයි. ගල්බඩ කෝරලයේ දණගිරිගල විහාරයේ තොරණෙහි දේව රූප හතරකි, වැඩිම ගණනක් රිදී විහාරයෙන් හමු වේ. දැවමය වූ විශාල ම කැටයම දෙගල්දොරු විහාරයෙහි ඇත (විමලවංශ හිමි 1992:512).

මකර තොරණ සහිත ශෛලමය දොර උළුවහු මහනුවර දළදා මාළිගාවේ, වාරියපොල පාදෙණිය විහාරයේ, දෙවිනුවර විශ්ණු දේවාලයේ, හඟුරන්කෙත පොත්ගුල් විහාරයේ වෙයි.

කොරවක්ගල විෂයෙහි මකර මුඛය භාවිතය එහි විකාශනයේ සිව්වැනි පියවරේ දී වීය. මකරාගේ දිව ලෙස පෙනෙන ලියවැල මකර කටින් විහි දී යාම, සුන්දර වස්තු වුව ද විනාශය ජන්ම කොටගෙන ඇති බව අර්ථවත් වේ. ලංකාවේ දී මත්ස්‍ය, හිස මුදුනේ ගැටයක් සහිත හා රහිත ලෙසමකරුන් වර්ග තුනක් කොරවක්ගල කැටයමට යොදාගන්නා බව චන්ද්‍රා වික්‍රමගේ පවසයි. රුවන්වැලි සෑයේ නැගෙනහිර පියගැටපෙලෙහි කොරවක්ගලෙහි මකරමුඛයෙන් නික්මෙන බොරදම් මුරගල දක්වා විහි දී වක්‍රව ඇත. මකර හිසේ කුඩුම්බියකි.

මුරගල විකාශනයේ හය වැනි අවස්ථාවේ දී මකර රූ භාවිත කර තිබේ. අභයගිරි රත්නප්‍රසාදයේ මුරගලෙහි දිසාපාලක රූපය දෙපස ඉහළට මුඛ දල්වාගත් මකරුන් දෙදෙනෙක් හා එයින් එළියට පනින සිංහයන් දෙදෙනෙකි. මුරගල මධ්‍යයෙන් මුඛ දල්වාගත් මකර කටවලට බිලිවෙන මිථුන රූප හා

වාමනයෝ දෙදෙනෙකි. අභයගිරියේ සන්නිපාත ශාලාවට බටහිරින් වන සංඝාරාමයක මකර මුඛයෙන් විහිදෙන ලියවැල් සහිත මුරගලකි.

සඳකඩ පහණෙහි ආවේණික සතුන් වෙනුවට ගම්පල යුගයේ දී මකර රූව එකතුව තිබේ.බෙලිගලින් හමු වූ සඳකඩ පහණේ පාදමේ දෙපසින් ඉදිරි පැන්නුම් අතර මකර රූප වේ. පිටත තීරුව මකර මුඛයෙන් නිකුත්වන සිංහ රූප වෙයි. හොරණ රජමහා විහාරයේ සඳකඩපහණ ද මකර රූව සහිත ය.

එක් මට්ටමකින් තවත් මට්ටමකට වතුර වැටීමට එළියට නෙරා නිමවූ තිරස් නලයේ අග කැටයම මකර කටකි. එතුළින් ගලන ජලය දිස්වන්නේ මකර කටෙහි දිව මෙනි (සිල්වා 2009:80). අනුරාධපුර විජයාරාමයෙහි සභා මණ්ඩපයේ එවැනි මකර පිහිළි වෙයි. ජේතවනාරාමයෙන් ලැබුණු යක්ෂණියකගේ රූවක් සහිත ලෝහ කැටයමක මකර රූව දැක්වෙයි. දඹේගොඩ බෝසත් පිළිමයේ මකුටයෙහි බුදුරුවට පහළින් දෙපසට කට අයා සිටින මකර රූ දෙකකි. පැළඳි මකර කුණ්ඩල දෙක දෙපසට හැරී කරමත පතිතව ඇත. කටිබන්දයේ ගාංචු සැරසිල්ලෙහි දෙපසට විහි දී මකර හිස් දෙකකි. (විජේසේකර 1990:18). අභිනව කැලණි විහාරයේ හා අම්බලන්ගොඩ සුන්දරාරාම විහාරයේ සණ්ඨාර කුලුණු මකර තොරණින් අලංකෘතය.

මකරා යනු විනාශය දක්වන සංකේතාර්ථයකි. මුරගල පිටුපස මුඛ දල්වාගෙන ඉදිරියෙහි දෑ ගිල දැමීමට සැරසෙන භයානක මකර රූවකි. මුරගලින් සශ්‍රීකත්වය, සෞභාග්‍යය, ලෞකිකත්වය මූර්තිමත් කරන්නේ නම් මකර රූව සහිත කොරවක්ගලින් විනාශය හඟවන බව කිව හැකිය. මකර කොරවක්ගල හා මුරගල සම්බන්ධකර අධ්‍යයනයේ දී හැඟී යනුයේ තෘෂ්ණාව, ආශාව ආදීලෞකික සැප පසුපස ඇත්තේ විනාශය බවයි.

විහාර ප්‍රවිෂ්ටයෙහි මකර තොරණ තේජාන්විත රාජ ලක්ෂණයක් ලෙස පිළිගැනෙයි. "සතුන් අතර සිහියෙන්, උදාර ගුණයෙන් ඇතා, බාහු බල වික්‍රමයෙන් සිංහයා, ශ්‍රවණ බලයෙන් සූකරයා, දෘෂ්ටි බලයෙන් වඳුරා, ඩැහැ ගැනීමට කිඹුලා, පිරුණු ශරීරයෙන් මත්ස්‍යයා ද වන හෙයින් මුළු රාජ්‍යය බලයම යොදා ශාසනය රක්නා බවත් දේව රූපයන්ගෙන් දෙවියන්ගේ සහයෝගය ලැබෙන බවත් ඉර හඳ මඟින් ඒවා පවතිනතාක් යන්නත් පැහැදිලි වේ (වික්‍රමසිංහ 2006:48-50).

මකර රුවින් පංචස්කන්දය නිරූපිත බව දැක්වෙයි. රූපයට කෑදර වඳුරාගේ ඇස් මඟින් රූපය, ශබ්දයට වඩාත් සංවේදී ඌරු කන් මඟින් ශබ්දය,ගඳසුවඳ ඇත් සොඬයෙන්,රස තෘෂ්ණාවට ගිජු කිඹුල් මුඛයෙන් රස,පාදවලින් ගොදුරු දැඩි ව ඇල්ලීමට සමත් සිංහ පාදයෙන් ස්පර්ශය සංකේතවත් කරයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


කුමාරස්වාමි, ආනන්ද (1962), *මධ්‍ය කාලීන සිංහල කලා*, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

චාල්ස් ඇස්.පී. (1999), *පාරම්පරික සිංහල සැරසිලි මෝස්තර සම්ප්‍රදාය*, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සිල්වා, ද නිමල් (2009), *සිංහල චිත්‍රය සහ මෝස්තර සම්ප්‍රදාය*, කොළඹ: නිර්මාණ සහ ප්‍රකාශකයෝ.